# ලංසු සඳහා ආරාධනයයි

## උසස් අධ්‍යාපන අංශය, නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

# පවිත්‍රතා සේවා සැපයීම 2019/2020

**HE/PR/NCB/2019/Janitorial**

01. නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය වෙනුවෙන්, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින්, උසස් අධ්‍යාපන අංශය සඳහා පවිත්‍රතා සේවා සැපයීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ. විස්තරාත්මක තොරතුරු අවශ්‍යතා ලංසු ලේඛනයන්හි සඳහන්ව ඇත.

02. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

03. ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් දෙදහස් පන්සියයක් (2500.00) ගෙවීමෙන්, 2019 මැයි 10 දින සිට බලපැවැත්වෙන පරිදි, කාර්යාල වේලාවන් තුළදී, රාජකාරි දිනවල, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් කොළඹ 07, වෝඩ් පෙදෙසේ, අංක 18, උසස් අධ්‍යාපන අංශයේ කාර්යාලයේදී මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතු වේ. අවශ්‍ය වැඩිදුර විස්තර, දුරකථන අංක 0112690955 මගින්, අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙතින් ලබාගත හැක.

04. රාජ්‍ය ආයතන හැර සියලුම ලංසුකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කළ, පිළිගත් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවකින් ලබාගත්, රුපියල් 20,000.00 වටිනා ලංසු ඇපකරයක් මගින් හෝ මුදලින් ගෙවීමෙන් ඉදිරිපත් කළ යුතුය. (ලංසු ඇපකරයේ වලංගු කාලය, ලංසුවේ වලංගු කාලයට වඩා දින 28ක් ඉදිරියේ තිබිය යුතුය)

05. ඒ අනුව, අදාළ පවිත්‍රතා සේවා සැපයීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් අදාළ සියලු විස්තර ඇතුළත්ව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ලංසු, **'මුල් පිටපත'** හා **'අනු පිටපත'** ලෙසට පිටපත් දෙකකින් සකස් කොට වෙන්වූ කවරවල බහා මුද්‍රා තබා එසේ සඳහන් කොට ඒවා යළි මුද්‍රා තැබූ එක් කවරයක බහා ඉදිරිපත් කළ යුතුය. අදාළ ලංසු බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ **'පවිත්‍රතා සේවා සැපයීම - 2019/2020'** යනුවෙන් සඳහන් කළ යුතුය.

06. ලංසු, **අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන), උසස් අධ්‍යාපන අංශය, අංක 18, වෝඩ් පෙදෙස, කොළඹ 07** යන ලිපිනයට, 2019 මැයි 30 වන දින පෙරවරු 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු හා ඉලෙක්ට්‍රොනික මාර්ගයෙන් යොමු කරනු ලබන ලංසු, භාරගනු නොලබන අතර, ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, අංක 18, උසස් අධ්‍යාපන අංශයේ අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලබන අතර, ලංසුකරුහට හෝ ඔහුගේ බලය පැවරූ නියෝජිතයකු හට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත.

07. ලංසු පිළියෙළ කිරීමේදී හෝ ගෙනැවිත් භාරදීමේදී ලංසුකරුවන්හට සිදුවිය හැකි යම් පිරිවැය හෝ වියදම් සම්බන්ධයෙන් නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය කිසිදු වගකීමක් දරන්නේ නැත.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,**
**උසස් අධ්‍යාපන අංශය, අංක 18, වෝඩ් පෙදෙස,**
**කොළඹ 07.**

**2019.05.10**